

# HYPOTHYROIDISM

## තයිරොයිඩ් හෝමෝන ඌනතාව



**වෛද්‍ය හර්ෂ අලුත්ගේ**
Dr Harsha Aluthge
MBBS, FRACGP, DFM RCGP(UK)
General Practitioner
Greenvale Medical Centre



තයිරොයිඩ් ග්‍රන්ථිය යනු අපගේ බෙල්ලේ ඉදිරිපස උගුරට පහලින් පිහිටා ඇති කොටස් දෙකකින් සමන්විත ග්‍රන්ථියකි.

එමගින් අපගේ ශරීරයේ යම් යම් ක්‍රියාවලීන් පාලනය




කරන වැදගත් හෝමෝනයක් වන (Thyroid Hormone) ස්‍රාවය කරනු ලබයි. එම හෝමෝනය මගින් අප ශරීරයේ වර්ධනය, ශක්තිය වැයවීම වැනි ක්‍රියා පාලනය කරන (Metabolic Function) අතර එය ඉතා සමතුලිතව ස්‍රාවයවීම ශරීරයේ නිසි ක්‍රියාකාරීත්වයට වැදගත් වේ. Hypothyroidism යනු තයිරොයිඩ් හෝමෙ-ෝනයේ ඌනතාවයක් නිසා හටගන්නා රෝගී තත්වයයි. එම ඌනතාවය නිසා ශරීරයේ ප්‍රතික්‍රියාවලි වේගය අඩපනවීම සිදුවේ.

තයිරොයිඩ් ග්‍රන්ථිය ආශ්‍රිත රෝගවලින් වඩාත්ම සුලභ වන්නේ මෙම Hypothy-roidism නැමැති තත්වයයි. විශේෂයෙන් එය කාන්තාවන් අතර සුලභ රෝගී තත්නවකි. කාන්තාවන්ගෙන් 6 - 10 % අතර ප්‍රමාණයකට මෙය පවතින බව හඳුනගෙන ඇති අතර වයස්ගත වන විට එම ප්‍රතිශතය තවත් ඉහළ යයි.

මෙම යනු තයිරොයිඩ් හෝමෝන් ඌනතාව ප්‍රධාන වශයෙන් ප්‍රාථමික (Primary) හා ද්විතීය (Secondary) වශයෙන් ප්‍රධන කොටස් දෙකකට බෙදිය හැකිය.

මෙයින් ප්‍රාථමික වර්ගය හටගන්නේ තයිරොයිඩ් ග්‍රන්ථියේ යම් ආබාධයක් හේතුවෙන් හෝමෝන ස්‍රාවය අඩුවීම මගිනි. ද්විතික වර්ගය හටගන්නේ තයිරොයිඩ් ග්‍රන්ථිය පාලනය කරන මොළයේ ඇති අවයවය වන පිටියුටරි ග්‍රන්ථියේ ඇතිවන රෝග තත්වයක් නිසාවෙනි.

මෙයින් වඩා සුලභ වන්නේ තයිරොයිඩ් ග්‍රන්ථියේ ඇතිවන ප්‍රථමික වර්ගය වන අතර බොහෝ විට Hashimoto's Disease ලෙස හඳුන්වන තම ශරීරයේ හටගන්නා ප්‍රතිදේහ මගින්තයි-රොයිඩ් ග්‍රන්ථියට හානි පැමිණාවීමෙන් ඇතිවන තත්වය වඩාත්ම සුලභ හේතුවයි. (Auto immune Disease)

- ■ ශරීරයේ ඇතිවන වෙහෙසකර ගතිය / අලස බව
- ■ බර වැඩිවීම
- ■ අධික ශිතල ඔරොත්තු නොදීම
- ■ මාංශපේශීවල විඩාව / වේදනාව
- ■ මුහුණේ තරබාරු ගතිය (Puffy Face)
- ■ මළබද්ධය
- ■ වියළි, රළු සමක් සහිත වීම
- ■ කෙස් හැලීම
- ■ අවධානය අඩුවීම
- ■ Goitre නැමැති තයි-රොයිඩ් ග්‍රන්ථියේ විශාලවීම

### තයිරොයිඩ් ඌනතාවට හේතු මොනවාද?

තයිරොයිඩ් ග්‍රන්ථිය මගින් T3 හා T4 යනුවෙන් හැඳින්වෙන හෝමෝන් දෙවර්ගයක් ස්‍රාවය කරනු ලබයි. මෙම ශ්‍රාවය පිටියුටරි ග්‍රන්ථිය මගින් එය පාලනය කරනු ලබන අතර ඔෆ්‍ෂ් නැමැති තවත් හෝමෝනයක් මගින් එය පාලය කරනු ලබයි.

ප්‍රධාන වශයෙන්ම මෙම T3 හා T4 නැමැති තයිරොයිඩ් හෝමෝන වල අඩංගු වන්නේ අයඩින් (iodine) නැමැති ඛනිජ වර්ගය වන අතර අප ආහාරයට ගන්නා මසුන් වැනි Sea food වල බහුලව අයඩීන් අඩංගු වේ.

### පහත සඳහන් හේතු මෙම ඌනතාවයට බලපෑ හැකිය

.

- ■ අයඩීන් ඌනතාව
- • Hashimoto's Disease නැමැති Auto immune රෝගී තත්වය
- ■ තයිරොයිඩ් ඌනතානවට කරන ප්‍රතිකාර මගින් ඖෂධ, විකිරණ ප්‍රතිකාර, ශල්‍ය කර්මය මගින් තයිරොයිඩ් ග්‍රන්ථියට හානි පැමිණීමෙන් හෝමෝන ස්‍රාවය අඩපන විය හැක.
- • X - ray වැනි සමහර විකිරණ පරීක්ෂණ මගින්
- ■ සමහර ඖෂධ වර්ග භාවිතයෙන් අතුරු ප්‍රතිවිපාක වශයෙන්
- ■ උත්පත්තියෙන් ඇතිවන තයිරොයිඩ් ග්‍රන්ථියේ ආබාධයක් නිසා
- ■ පිටියුටරි ග්‍රන්ථියේ රෝග තත්වයක් නිසා

### Hypothyroidism රෝග තත්වය නිර්ණය කර ගන්නේ කෙසේද?

ඉහත සඳහන් කළ රෝග ලක්ෂණ පවතින අයෙකුට රෝගය ඇති බවට සැක කෙරෙන අතර රුධිරයේ THS හා T3 හා T4 හෝ-මෝ න පරීක්ෂාවක් මගින් රෝගය ඇතිබවට හඳුනා ගත හැකිය.

මීට අමතරව තයිරොයිඩ් ග්‍රන්ථිය විශාලවී ඇතිනම් (goiter) එහි ක්‍රියාකාරීත්වය හා ප්‍රමාණය නිර්ණය කර ගැනීම සඳහා Ultra Sound Scan හෝ Radioactive Iodine Scan නැමැති විකිරණ පරීක්ෂණ සමහර විට සිදු කරනු ලැබේ.

### ප්‍රතිකාර මොනවාද?

අයඩින් ඌනතාවය සඳහා අයඩින් අඩංගු ආහාර හෝ ලුණු (Iodide Solt) නිර්දේශ කරනු ලැබේ. මීට අමතරව Thyroxin නැමැති හෝමෝන පෙති පාවිච්චියට ගැනීමට නිර්දේශ කරනු ලැබේ.

මෙම Thyroxin පෙති පාවිච්චි කිරීම නිසා තයිරොයිඩ් හෝමෝන මට්ටම උවමනාවට වඩා වැඩි වීමෙන් Hypothyroidism නැමැති තත්වයට පත්විය හැකිය. එබැවින් ප්‍රතිකාරක අතරතුර විටින් විටTHS හා T3 හා T4 නැමැති හෝමෝන මට්ටම රුධිර පරීක්ෂාවක් මගින් මැන ගත යුතුය.